# කෝට්ටේ යුගයේ විරචිත සන්දේශ කාව්‍යවලින් හෙළි වන තත් කාලීන දේවවිශ්වාස පද්ධතිය පිළිබඳ අධ්‍යයනයක්

කනංගමුවේ රාහුල හිමි

තිඹිරිවැව සිරිසුමන හිමි

**Abstract**

Kotte Period is considered as the golden period of Sinhala Sandesha (Sandēśa) Literature. through the Sandesha composed in this era, a large amount of socio-economic, political, and religious information would be be obtained. since, this was an era where deity belief (belief in God) was widespread, Kings, monks as well as the general public tend to be included with the deity belief. The Buddhist temples and temple for gods had also become very popular. Devotees gathered around temples as well as Hindu devale for religious purposes. The fact that the deity belief was thoroughly spread in the Jayawardenepura Kotte Kingdom and the entire country word be justified as would be seen as devalayas sitnated at many places across the country. Majority of them where deovteed to hindu gods. Evidence is found regarding the fact that in addition to Ganeshwara (ganēṣvara), Ishwara (īśvara), and other gods, Kali Pattini Goddess was subjected to special focus of the people. In this small article, it is studied how much the deity system was included in the mass society during the Kotte Period by referring to devale mentioned in the Sandesha.

**Keywords:-** Buddhist temple, Deity Belief System, Devale, Kotte Period, Sandesha

## ප්‍රවේශය

කිසියම් සාහිත්‍ය කෘතියකට තත් කාලීන සාමාජාර්ථික පසුබිම ඍජු ව හෝ වක්‍ර ව බලපෑම අනිවාර්ය සාධකයකි. සමාජයෙන් තොර සාහිත්‍ය කෘතියක් පිළිබඳ සාකච්ඡා කළ නො හැකි ය. සාහිත්‍ය කරණයේ නිමග්න වන සාහිත්‍යකරුවා ද සමාජය නියෝජනය කරන්නෙකු නිසා ඔහුගේ සාහිත්‍ය නිර්මාණවල සමාජය පිළිබිඹු වීම අනිවාර්ය ලක්ෂණයකි. ඒ අනුව කතුවරයා ජීවත් වන සමාජය හා එහි ලක්ෂණ සාහිත්‍ය කෙරෙහි බලපානු ලැබේ. සිංහල සාහිත්‍ය විෂයෙහි භාරතීය සාහිත්‍ය කෘතිවලින් යම් බලපෑමක් තිබී ඇති අතර වර්තමානයේ සිංහල සාහිත්‍ය ලෙස හඳුන්වනු ලබන  කෘතිවලින් සම්පූර්ණයෙන් ම සිංහල සමාජය  නියෝජනය නො වේ. ඒවායේ දක්නට ලැබෙන්නේ භාරතීය සමාජය යි. සිංහල සමාජයට අදාළ තොරතුරු ඒවායේ ඉතා අල්ප වශයෙන් දක්නට ලැබෙන බව තහවුරු කළ හැකි ය.

සිංහල සන්දේශ ආකෘතිය හැඩගස්වාගෙන ඇත්තේ මහාකවි කාලිදාසගේ **මේඝදූතය** ඇසුරෙනි. මහාකාව්‍යලක්ෂණ අන්තර්ගත ඇතැම් කරුණු සන්දේශ ආකෘතිය ගොඩනැඟීමෙහි ලා බලපෑම් ඇතිකොට තිබේ. ලාංකේය සන්දේශ කාව්‍යවල නිරූපණය වන්නේ භාරතීය ආකෘතියට ලාංකේය තොරතුරු සම්මිශ්‍රණය කරමිනි. සම්භාව්‍ය සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍ය කෘතිවල සැබැවින් ම නිරූපිත ව ඇත්තේ  ලාංකේය සමාජය ම දැයි අප විසින්  විමර්ශනය කළ යුතු ය. අනුරාධපුර යුගයේ සිට සෑම සාහිත්‍ය යුගයක ම රචනා වූ කෘති ඉතා සමීප ව විමසන කල්හි එම කෘතිවල භාරත සමාජය සහ ලාංකේය සමාජය ද නිරූපිත ව ඇති බව පෙනේ. මෙයිනුත් වැඩි ඉඩක් ලබාගෙන ඇත්තේ භාරතීය සමාජ පරිසරය නිරූපණය කරනු වස් ය.

මේ සඳහා බලපා ඇති සාධක රැසක්  සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යය හා පද්‍ය සාහිත්‍ය ලෙස සම්භාවනාවට පාත්‍ර ව ඇති කෘතිවලින් වැඩි ප්‍රමාණයක් පාලි හෝ සංස්කෘත සාහිත්‍ය ආශ්‍රයෙන් සිංහලයට පරිවර්තනය වූ ඒවා වේ. තත් කෘතිවල වැඩිපුර ම දක්නට ලැබෙන්නේ භාරත සමාජය පිළිබඳ තොරතුරු ය. ඒ නිසා ම සම්භාව්‍ය

සිංහල සාහිත්‍ය කෘතිවල ලාංකේය සමාජය පිළිබඳ තොරතුරු ඉතා අල්ප වශයෙන් ඇතුළත් ය.

සිංහල සමාජය හා බැඳුණු තතු මැනවින් දත හැකි සාහිත්‍ය ප්‍රවර්ගය වන්නේ සිංහල සන්දේශ සාහිත්‍ය කෘති වේ. එහි අන්තර්ගත සන්දේශ ආකෘතිය සිංහලයට දායාද වූයේ භාරතයෙනි. කාලිදාසයන්ගේ **මේඝදූත කාව්‍යය** පාදක කොටගෙන තත් ආකෘතියට අනුගත ව සිංහල සන්දේශ හෙළ සාහිත්‍යයක් බිහිවිණි. සන්දේශ ආකෘතිය භාරතයෙන් ගනු ලැබූව ද තත් සාහිත්‍යයේ අන්තර්ගතය හැඩගස්වාගෙන ඇත්තේ දේශීය තොරතුරුවලිනි. දාහත්වන සියවසේ සිට ලංකාවේ ඇතැම් සමාජ තතු විමර්ශනය කරන්නෙකුට සිංහල සන්දේශ සාහිත්‍යයෙන් ලැබෙන ඉමහත් පිටිවහලකි.

**පර්යේෂණ ගැටලුව**

කෝට්ටේ යුගයේ සන්දේශකෘතිවලින් තත් යුගයේ දේව විශ්වාස පිළිබඳ ව කෙබඳු තොරතුරු හමුවේ දැයි විමසීම.

**පර්යේෂණ ක්ෂේත්‍රය**

කෝට්ටේ යුගයේ සංදේශ කාව්‍ය පමණක් මෙහි පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස භාවිත කෙරේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙය සම්පූර්ණයෙන් ම පුස්තකාලයීය අධ්‍යයනයකි.

**සාකච්ඡාව**

සිංහල සන්දේශ කාව්‍යවල ද්‍රවිඩ ජනයා පිළිබඳ සඳහන් වේ. පුරාතන යුගයේ දී ම දෙමළ ජනතාව ශ්‍රී ලංකිකයන් සමඟ එකට ජීවත් වූ බව පෙන්වා දිය හැකි ය. දෙමළ ජනයා වෙනුවෙන් ඉදිකරන ලද කෝවිල් ගණනාවක් පිළිබඳ තොරතුරු සන්දේශ කාව්‍යවල සඳහන් ව ඇත. ගණ දෙවියන් සඳහා සකස් කරන ලද කෝවිලක් පිළිබඳ සඳහන් වේ. එහි දෙමළ කවීන් පිළිබඳ ව ද දක්වා ඇත. (**පරෙවි සන්දේශ**, 2014:145 පද්‍ය 332). දෙමළ ජනයා සිය දේවස්ථාන කරා

රැස් ව කවි කියමින් දෙවියන් පිදූ ආකාරය දක්නට ලැබේ. මෙම දේවාලය ගණ දෙවියන් කේන්ද්‍ර කොටගෙන සකස් කරන ලද්දකි. ගණ දෙවියන් නුවණට අධිපති හින්දූහු සලකති. මේ නිසා ම පශ්චාත් කාලීන ව සිංහල ජනයා අතර ගණ දෙවියන් ඉතා ජනප්‍රිය වූ ආකාරය තහවුරු වන්නේ **ගණදෙවි හෑල්ල** වැනි කෘති මහනුවර යුගයේ දී රචනා වීමෙනි. මෙම දෙවියන්ට කැප කරන ලද කෝවිලක් වැල්ලේ මඩමේ පිහිටා තිබූ බවට සාධක **පරෙවි සන්දේශයෙන්** ලැබේ. (**පරෙවි සන්දේශය**, 2014: 134 පද්‍යය 302). ඉහත සඳහන් කරන ලද වැල්ලේ මඩමේ ගණදෙවි කෝවිල පිළිබඳ **කෝකිල සන්දේශයේ** ද දැක්වේ. (**එම**, 42 පද්‍ය 46). ගණ දෙවියන්ට ම කැප වූ ගණිඳු කෝවිලක් ගැන **කෝකිල සන්දේශයේ** ද දක්වා ඇත. දෙව්නුවර සිට යාපනය දක්වා ගමන් කරන කොවුලාට ද එය දක්නට ලැබේ. ද්‍රවිඩ සංස්කෘතයේ දක්නට ලැබෙන ගණ දෙවියන්ට ඉටු කරන ආගමික සංස්කෘතිකාංග ද මෙහි දක්වා ඇත. (**කෝකිල සන්දේශය, 1962:102 පද්‍ය 96**).

දෙ වන ගණිඳු කෝවිල දක්නට ලැබෙන්නේ කලුතර දී ය. මෙය උතුරු කලුතර පිහිටි බව ඊ. තෙන්නකොන් පෙන්වා දෙයි (**තෙන්නකෝනුන්, 1960: 577**). කෝට්ටේ යුගයේ රචනා වූ සන්දේශ කාව්‍යවලින් පමණක් නො ව **තිසර සන්දේශයෙන්** ද මෙය තහවුරු වේ (**සුරවීර, 1991: 3 පද්‍යය 97**). පුරාණයේ සිට වැල්ලේ මඩම පිහිටි ප්‍රදේශයේ ද්‍රවිඩ ජනයා ජීවත් වූ බව පෙනේ. ඔවුන් ට වැඳීම් පිදීම් සඳහා ගණදෙවි කෝවිලක් ඉදි කරන ලද බව පෙන්වා දිය හැකි ය. කෝට්ටේ හෙවත් ශ්‍රී ජයවර්ධනපුර ඊශ්වර කෝවිලක් ද ඉදි කොට තිබූ බව **සැළලිහිණි සන්දේශයෙන්** තහවුරු කොට ගත හැකි ය.

කළුවැල් කපුරු දුම තුළ ලෙළෙන දද පෙළ
සුවිසල් මිහිගු සක් සන් මිණි හඬ පතළ
කැරැලොල් සතන් පවසන තියු ගී දෙමළ
මනකල් ඉසුරු කෝවිලැ ලගිනේ ලකළ

(**ධර්මාරාම, 2018: 22 පද්‍ය 51**).

ශ්‍රී ජයවර්ධනපුර පිහිටුවා තිබූ දේවාලය ඊශ්වර දෙවියන් සඳහා සකස් කරන ලද්දකි. වර්තමානයේ මෙය අංගොඩට නුදුරුව පිහිටි ප්‍රාසාද ගොඩැල්ල නම් ප්‍රසිද්ධ තැනක් බවත් එහි නෂ්ටාවශේෂ වර්තමානයේ ද දක්නට ලැබෙන බවත් ධර්මාරාම හිමියෝ පෙන්වා දෙති (එම.53).

මේ දේවාලය පුද පූජාවලින් සමන්විත වූ බව තහවුරු වේ. ජයවර්ධනපුර සමයේ රජතුමා හා ද්‍රවිඩ ජනයා අතර ඉතා සමීප සම්බන්ධයක් තිබූ බව පෙන්වා දිය හැකි ය. රජතුමාගේ දියණියක නන්නූර්තුනයාර් නම් දෙමළ ඇමතියාට විවාහ කොට දී තිබිණ. සපුමල් හෙවත් සෙම්බගප්පෙරුමාල් කුමාරයා හා අම්බුලුගල කුමාරයා දෙමළ ජාතික පනික්කි නම් පුද්ගලයාගේ දරුවන් ය. ශ්‍රී ජයවර්ධනපුර නගරයේ මේ ඊශ්වර කෝවිල ඉදි කොට තිබීමෙන් තහවුරු වන්නේ රාජකීය ද්‍රවිඩයන් ඇතුළු අනෙක් සාමාන්‍ය ද්‍රවිඩ ජනතාව වන්දනා මාන කටයුතු සිදු කරමින් ආගමික වතාවත්වල යෙදීම සඳහා ඊශ්වර දෙවොල ඉදි කරන්නට ඇති බව යි. හින්දු ආගමේ ත්‍රිමූර්තියෙන් එක් මූර්තියක් වන ඊශ්වර දෙවියන් කෝට්ටේ යුගය වන විට ජනයා අතර වන්දනයට මෙන් ම පූජාවට ද ලක් වූ බව පෙන්වා දිය හැකි ය.

කෝට්ටේ යුගයේ ජනයා අතර ඉමහත් බුහුමනට පාත්‍ර වූ දෙවියෙකු ලෙස මහසෙන් දෙවියන් හඳුනාගත හැකි ය. ෂන්මුඛ, කාර්තිකේය හා කඳකුමාර යනුවෙන් හඳුන්වන්නේ ද කතරගම දෙවියන් ම වේ. කැලණියේ විභීෂණ දේවාලය කරා ගමන් ගන්නා සැළලිහිණියාට ද කතරගම දෙවියන් සඳහා ඉදිකළ මේ දේවාලය දැක ගන්නට ලැබිණ (ධර්මාරාම, 2018: 26, 58). **පරෙවි (පරෙවි සන්දේශය, 2014: 45 පද්‍ය 136).** හා **කෝකිල (කෝකිල සන්දේශ වර්ණනා, 134: පද්‍ය 138).**

ස්කන්ධ දෙවියන් පරවාණි නම් මයූරයෙකු වාහනය කොටගෙන සිටින අතර එක් අතෙක දුන්නක් ද අනෙක් අතේ ඊතලයක් ද ඇත **(සන්නස්ගල,2010:73).** ස්කන්ධ දෙවියන්ට කෞමාරි හෙවත් සේනා යනුවෙන් බිසවක් ද වල්ලි අම්මා යනුවෙන් තවත් බිරිඳක් ද වෙති (එම). කෝට්ටේ යුගයේ සිටි ද්‍රවිඩ ජනයා අතර ස්කන්ධ කාර්තිකේය යනාදී නම්වලින් හඳුන්වනු ලබන දෙවියන් ජනප්‍රිය වී තිබූ බව යි.

හින්දූන්ගේ දේව සමූහයට අයත් ස්කන්ධ කුමාර සිංහල දේවතාවෙකු බවට පත් වී ඇත. දීර්ඝ කාලයක් පුරා දෙමළ ජනයා ආශ්‍රය නිශ්‍රය කිරීම නිසා ඔවුන්ගේ ඇදහිලි මෙන් ම විශ්වාස පද්ධතිය ද සිංහල ජනයා කෙරෙහි බලපා ඇත. එලෙස බලපෑ දේව වන්දනයක් ලෙස කතරගම දෙවියන් නමින් හඳුන්වන ෂන්මුඛ දේව වන්දනය හඳුනාගත හැකි ය. ''සේනාපති සිද්ධසේන යුද්ධ රංග කුමාර ශුභ ශක්තිධර සුබ්‍රහ්ම ගණ්‍ය ගංගාපුත්‍ර කාර්තිකේය හා තාරකජිත් යනාදී නම් ද කඳකුමරුට භාවිත කෙරේ'' (**සන්නස්ගල, 2010:73**). මේ දෙවියන්ගේ ලංකා ගමනය කුමක් සඳහා සිදු වූයේ ද යන්න අප්‍රකාශිත බව සන්නස්ගල පෙන්වා දෙයි (**සන්නස්ගල, 1962: 163**). දැනට ලැබී ඇති සන්දේශවල මේ දෙවියන්ට සිදු කරන ආයාචනා නැතත් මහනුවර හා මාතර යන යුගවල දී රචනා වූ සන්දේශවලින් වැඩිදුර ප්‍රමාණයක් රචනා කොට ඇත්තේ ස්කන්ධ දේවායාචනය සඳහා ය (**එම.164**).

ගම්පොළ කෝට්ටේ යුගවලට වඩා පශ්චාත් කාලීන යුගවල දී ද්‍රවිඩ හින්දු සමාජයට සමගාමී ව සිංහල සමාජයේ ද මේ දෙවියන් බුහුමනට පාත්‍ර ව තිබේ. හින්දූන්ගේ දෙවියෙකු වූ සවත් හෙවත් කඳ සුරිඳු කෝට්ටේ යුගය වන විට සිංහල බෞද්ධ දෙවියෙකු බවට පත් කොටගෙන තිබේ. **හංස සන්දේශ** කතුවරයා රතන සූත්‍රය කියා ලබා ගන්න වූ පුණ්‍ය ශක්තිය ස්කන්ධ දෙවියන්ට ද අනුමෝදන් කිරීමෙන් මෙය තවත් තහවුරු වේ. (**හංස සන්දේශය, 2012, 201 පද්‍යය: 425**). හංස සන්දේශ කතුවරයා ද හංසයාට දේව මන්දිරයට ප්‍රවේශ වී වන්දනා කරන්න යැයි ඇරියුම් කර ඇත (**එම.46 පද්‍ය 192**).

හින්දු දහමේ සත්වයන්ට දේවත්වය ආරෝපණය කොට ඉතා භක්තියෙන් වන්දනා මාන කරනු දක්නට ලැබේ. **පරෙවි සන්දේශ** කතුවරයා පරෙවියාට නාග කෝවිල දැක ගැනීමට අවස්ථාව සලසා දෙයි (**පරෙවි සන්දේශය, 2014: 133, පද්‍ය 301**). ඉරුගල්කුල නායක හිමියන්ට සිය දූතයාට එම අවස්ථාව සලසා දී ඇත. පරෙවි සන්දේශයට වඩා මෙහි දක්නට ලැබෙන විශේෂතාව නම් නාග කෝවිලේ නාග රූපය දකින කතුවරයා එයට බෞද්ධ පදනම ආරෝපණය කිරීමයි. එනම් ඒ නාග රූපය මුචලින්ද නාග රූපයට සමාන කිරීම යි. (**කෝකිල සන්දේශ වර්ණනාව, 1962:214 පද්‍ය 50**). එනම් නාග කෝවිලේ නාග

රූපයක් අඹා එයට වන්දනා මාන ගරු සත්කාර ආදිය කරමින් එවක ජනයා ආශීර්වාද ලබාගත් බව පෙන්වා දිය හැකි ය.

බෙන්තර ප්‍රදේශයේ කාලි කෝවිලක් පිහිටා තිබිණ. එහි කාලි දේවතාවිය සඳහා නර්තන පූජා සිදු කරන ලද බව ද **පරෙවි සන්දේශයේ** දක්වා තිබේ. (**පරෙවි සන්දේශය, 2014: 72, පද්‍ය 186**). කාලි දේවතාවිය ද භාරතීයන්ගේ වන්දනයට පාත්‍ර වන දේවතාවියකි. එවක ලංකාවේ සිටි ද්‍රවිඩයන් කාලි දේව වන්දනය ඉතා සිදු කළ බව මෙයින් තහවුරු වේ.

මුන්නේස්සරමේ පිහිටා තිබූ ඊශ්වර දේවාලය පිළිබඳ ව ද (**කෝකිල සන්දේශ වර්ණනාව, 1962: 186 පද්‍ය 178**). දක්වා තිබේ. වර්තමානයේ පවා මෙකී දේවාලය හින්දූන් අතර පමණක් නො ව සිංහල ජනයා අතර ද ඉතා ප්‍රසිද්ධ දේවාලයකි. කෝකිලයාගේ නෙත ගැටෙන තවත් දේවස්ථානයක් නම් අය්යන් කෝවිල යි. එය නායන්වෙලි ප්‍රදේශයේ පිහිටා තිබූ බව **කෝකිල සන්දේශය** තහවුරු කරයි (**කෝකිල සන්දේශ වර්ණනාව, 1962: 206 පද්‍ය, 196**). දේවාලය වෙල්යායක් සමීපයේ පිහිටා ඇත. එම වෙල්යාය නයියත් නමින් හඳුන්වා ඇති බවත් දෙවියන්ගේ වෙල යන නාමය එහි ඇති බවත් ඇතැමෙක් පෙන්වා දෙති (**එම**,197). මෙම දෙවියන් අයියර් යන නාමයෙන් ද හඳුන්වනු ලැබේ. මොහු දකුණු ඉන්දියාවේ ජනප්‍රිය දෙවියෙකි. දකුණු ඉන්දියාවෙන් ලංකාවට සංක්‍රමණය වූ ජනයා මේ දෙවියන් වඳිනු පුදනු දක්නට ලැබේ (**එම**,197-198).

තත් දේව වන්දනය ලංකාවට රැගෙන විත් ඇත්තේ දක්ෂිණ භාරතීය ජනයා ය. ඔවුන් ලංකාවේ ස්ථිර ව ජනාවාස පිහිටුවා ගත් පසු සිය වන්දනාමානන කටයුතු සඳහා දකුණු ඉන්දියාවේ සිටිය දී වැඳුම් පිදුම් කළ අයියර් දෙවියන් ම ලංකාවට ද රැගෙන පැමිණි බව දක්නට ලැබේ.

සුදර්ශන දෙවියන් පිළිබඳ **පරෙවි සන්දේශයේ** දක්වා තිබේ. (**පරෙවි සන්දේශය, 2014: 55 පද්‍ය 157**). මෙහි සඳහන් වන දෙවියන් කවුරුන් දැයි ස්ථිර ව කිව නො හැකි බවත් එහෙත් ඒ ඊශ්වර දෙවියන් විය හැකි බව සිරිතිලක සිරි උපකල්පනය කරයි (**එම** 158). ගම්පොළ යුගයේ රචනා වූ **තිසර සන්දේශයේ** ද මේ සුදර්ශන දේවාලය පිළිබඳ සඳහන් වේ (**තිසර සන්දේශය, 1991: 87, 142**).

එම දේවාලය දේශීය දෙවියකු සඳහා තනන ලද දෙවොලක් බව සුරවීර උපකල්පනය කරයි (**එම**). මෙම දේවාලය මේ ප්‍රදේශයේ ඉදිකර ඇත්තේ ද්‍රවිඩ ජනයා විශාල ප්‍රමාණයක් මේ ප්‍රදේශයේ විසූ නිසා යැයි සිරිතිලක සිරි පෙන්වා දෙයි. (**පරෙවි සන්දේශය, 2014:158**).

පත්තිනි දේව වන්දනයට ද මෙවක ජනප්‍රිය ව තිබිණ. ගජබා රජතුමා විසින් කරන ලද ප්‍රාසාදය වැනි ප්‍රාසාදයක් පරාක්‍රමබාහු රජතුමා කළ බවත් එම පත්තිනි දේව මන්දිරයේ පූජාව නරඹා යන ලෙසත් කෝකිලයාට ආයාචනා කරයි (**කෝකිල සන්දේශ වර්ණනාව, 1962: 118 පද්‍ය, 113**). ගජබා රජතුමා විසින් ලංකාවට පත්තිනි සළඹ රැගෙන එන ලදුව ලංකාවේ පත්තිනි දේව වන්දනය ජනප්‍රිය විය. මෙම ස්ථානය විහාරයක් නොව පෙර කී පත්තිනි සළඹ තැබීම සඳහා ඉදි කරන ලද දේවාලයක් බවත් එය පැපැලියාන හා කෝට්ටේ අතර ප්‍රදේශයේ යටියන නම් ස්ථානයේ ඉදි කරන ලද බවත් ගුණවර්ධන පෙන්වා දෙයි (**කෝකිල සන්දේශ වර්ණනාව, 1962: 114**).

භාරතයෙන් පත්තිනි සළඹ ලංකාවට රැගෙන පැමිණියේ භාරතයෙන් ලංකාවට එම රජතුමා විසින් රැගෙන පැමිණි සිරකරුවන්ට වන්දනය පිණිස ය. ඒ වන විට ද ලංකාවේ දෙමළ ජනයා ජීවත් වන්නට ඇත. දෙමළ ජනයා අතර ඉතා ජනප්‍රිය පත්තිනි දේවතාවිය පශ්චාත් කාලීන ව සිංහල ජන සමාජයේ ද ඉතා ඉහළ ජනප්‍රියතාවක් ලබාගෙන තිබේ. කෝට්ටේ ඉදි කරන ලද පත්තිනි දේවාලය ගජබා රජ දවස සිට තිබූ දේවාලයකි. එය පරාක්‍රමබාහු රජ දවස ද නැවත එතැන ම ඉදි කොට ඇත. කෝට්ටේ රාජධානිය සමීපයේ හින්දු දෙවිවරුන් කිහිපදෙනෙකු උදෙසා ම දේව මන්දිර සකස් කොට තිබිණ. එනම් කෝට්ටේ සමීපයේ ද්‍රවිඩ ජනයා බහුල ලෙස ජීවත් වූ බව ද නිගමනය කළ හැකි ය.

දෙව්නුවර සිට යාපනය දක්වා යන කෝකිලයාට රාමේශ්වර නම් දෙවියන් සඳහා ඉදි කරන ලද දේවාලය (**කෝකිල සන්දේශ වර්ණනා, 1962: 255 පද්‍ය, 226**). පුනාල හෙවත් කඩවුල් නම් දිව්‍ය රාජයා උදෙසා කරන ලද දේවාලය දක්නට ලැබිණ (**එම. 256;226**). දීර්ඝ කාලයක් ආර්ය සක්විතීන් විසින් යාපාපටුන සිය බලයට නතු කොට ගෙන තිබූ නිසා උතුරුකරයේ ද්‍රවිඩ ජනයා බොහෝ සෙයින්

ජීවත් වූවාට සැක නැත. ඔවුන්ගේ ආගමික අවශ්‍යතා නිසා දිව්‍ය මන්දිර හෙවත් දෙවොල් ඉදි කරන වූ බව නිගමනය කිරීම සාධාරණ ය.

ගම්පොළ හා කෝට්ටේ යුගයේ රචනා වූ සන්දේශවල අන්තර්ගත තොරතුරු අනුව ශ්‍රී ලාංකේය සමාජය තරමක් සංකීර්ණ ලක්ෂණ නිරූපණය කරන ලද බව පෙන්වා දිය හැකි ය. සිංහල ජනතාවට අමතර ව දෙමළ ජනතාව ද රටේ නොයෙක් ප්‍රදේශවල ජීවත් වූ බව පෙන්වා දිය හැකි ය.

වයියා කරණනත් - දෙමළ කිවිවර රඳනා

පයියාගල වෙහෙර - මුනිඳු දැක නැම ද යව සතොසින් **(කෝකිල සන්දේශ වර්ණනාව 1962ඃ 95 පද්‍ය 93).**

පයාගල ප්‍රදේශයේ සිටි දෙමළ කිවිවරුන් පිළිබඳ කෝකිල කතුවරයා ද දත් බව මෙයින් පැහැදිලි වේ. පරෙවි සන්දේශයේ ද සඳහන් වන ආකාරයට වැල්ලේ මඩමේ ගණිඳු කෝවිලේ ද දෙමළ ස්තුති ගීතිකා ගායනය කිරීමෙන් තහවුරු වන්නේ තත් කෝවිල අවට ප්‍රදේශවල දෙමළ ජනතාව වාසග්‍රහණය කළ බව යි. එය පහත දක්වා ඇති පද්‍යයෙන් ද තහවුරු වේ.

පසිඳු රාම සන්දර වෙසිඳුගෙ නමින
ගණිඳු විමන අලුයම් බෙර ගත ගොසින
පුබුදු දෙමළ කිවි මියුරන් සහතොසින
සිනිඳු කෙකා නදවන් තියු ගී කියන

**(පරෙවි සන්දේශය 2014ඃ 145, පද්‍ය 322).**

මේ ගණදෙවි කෝවිල ඉදිකොට ඇත්තේ ද වෛශ්‍යයෙකි. හේ රාමසන්දර නමින් ප්‍රසිද්ධ වූ අයෙකි. ද්‍රවිඩයෙකු වූ ඔහු මෙම ස්ථානයේ ගණදෙවි කෝවිලක් ඉදිකර ඇත්තේ මේ ප්‍රදේශයේ විසූ ද්‍රවිඩ ජනයාට වන්දනා මාන සිදු කිරීම සඳහා ය. තොටගමුවේ විජය

බා පිරිවෙනේ විෂය නිර්දේශයේ ද දෙමළ භාෂාව අන්තර්ගත ව තිබිණ. (**ගිරා සන්දේශය, 2011: 227 පද්‍ය, 358**). කාලීන අවශ්‍යතාව අනුව දෙමළ භාෂාව ශ්‍රී ලංකාවේ ජනප්‍රිය ව තිබිණ.

තොටගමු විහාරස්ථානයේ ම නාථ දේවාලයක් පිහිටා තිබූ බවට සාධක **පරෙවි සන්දේශයෙන්** ලැබේ (**පරෙවි සංදේශයන්දේශය, 2014; 80 පද්‍යය, 204**). **ගිරා සන්දේශයෙන්** ද එය තහවුරු වේ.(**ගිරා සන්දේශය, 2011; 198, 325**). එහි සඳහන් වෙන්නේ නාථ දෙවියන් බෝධිසත්ව වරයෙකු ලෙස ය (**එම. 11 පද්‍ය; 52**). මෙවක නාථ දේව වන්දනය ඉතා ජනප්‍රිය ව තිබූ බවට මෙය ප්‍රධාන සාධකයකි. කෝට්ටේ යුගයේ හින්දු දේව වන්දනය අමතර ව බෞද්ධ දේව වන්දනය ජනප්‍රිය ව තිබූ බවට මෙය කදිම සාධකයකි. මහායාන බුදු දහම නාථ වැනි දෙවිවරු මහායාන බුදු දහමේ සඳහන් නාථ වැනි දෙවිවරුන්ගේ පිහිට හා ආරක්ෂාව මේ යුගයේ ජනයා ප්‍රාර්ථනා කළ බවට මෙය කදිම සාධකයකි.

## සමාලෝචනය

කෝට්ටේ සමාජය බුදු දහමට මෙන් ම හින්දු දේව වන්දනය කෙරෙහි ද බොහෝ සෙයින් නැඹුරු තිබිණ. මේ සඳහා තත් කාලීන සමාජ ආර්ථික දේශපාලනික කරුණු මූලික වශයෙන් හේතු වී තිබේ. හින්දූන් අතර ජනප්‍රිය ගණේෂ ඊශ්වර වැනි දෙවියන් ද කාලි අම්මා පත්තිනි මෑණියෝ දේවතාවියන් ද මෙකල සමාජයේ ජනප්‍රිය ව තිබිණ. ඒ හැරුණු කොට කෝට්ටේ යුගයේ ලංකාවේ බොහෝ ස්ථානවල හින්දු දේවාලය ඉදි කොට තිබූ බවක් සන්දේශවලින් තහවුරු වේ. අනුව දේව වන්දනයට රුචි වූ පිරිස වැඩි වූ නිසා හින්දු දේවාලය සංස්කෘතියක් ශ්‍රී ලංකාවේ අනිත් යුගවලට වඩා ජනප්‍රිය වූ බව තත්කාලීන සංදේශවලින් පිළිබිඹු වන බව ඉහත සාකච්ඡාවෙන් පැහැදිලි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


1. කුමාරතුංග, මුනිදාස (1933). *ගිරා සනෙදස විවරණය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ
2. ගම්ලත්, සුචරිත (1997). *එළු සඳස් ලකුණේ නිදසුන් පද්‍ය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

3. ගුණවර්ධන, ඩබ්ලිව්.එෆ් (1916). *ගුත්තිල කාව්‍ය වර්ණනා.* පානදුරඃ N.J.COOREY & SONS, COLOMBO.

4. ගුණවර්ධන, ඩබ්ලිව්.ඇෆ් (1962). *කොකිල සන්දෙශ වර්ණනා.* කොළඹඃ මහාබොධි යන්ත්‍රාලය.

5. ගුණසේකර, බන්දුසේන (1996). *සිංහල සාහිත්‍ය.* කොළඹඃ ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.

6. ගුණසේකර, බන්දුසේන (1997). *කෝට්ටේ යුගයේ සන්දේශ කාව්‍ය.* සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

7. ගොඩකුඹුරේ, සී.ඊ (1953). *හංස සන්දෙශය.* කොළඹඃ සීමාසහිත කොළඹ ඇපොතිකරීස් සමාගම.

8. ජයතිලක, කේ (1990). *විමර්ශන සහිත මයූර සන්දේශය.* දෙල්ගොඩඃ ප්‍රදීප ප්‍රකාශකයෝ.

9. ජයතිලක, ඩී.බී (1940). *සිංහල සාහිත්‍ය ලිපි.* කොළඹඃ සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

10. ජයතිලක, ඩී.බී (2004). *කතිකාවත් සඟරා.* කොළඹඃ රත්න පොත් ප්‍රකාශකයෝ.

11. ඥානාලෝක හිමි, කෝදාගොඩ (1971). *සිදත්සඟරා පුරාණ සන්නය.* වැලිගමඃ හේමචන්ද්‍ර වී. ගුණසේකර.

12. තිලකසිරි, සිරි (1996). *තිසර සන්දේශය.* කොළඹඃ රත්න පොත් ප්‍රකාශකයෝ.

13. තිලකසිරි, සිරි (2005). *පරෙවි සන්දේශය.* කොළඹඃ රත්න පොත් ප්‍රකාශකයෝ.

14. තිලකසිරි, සිරි (2006). *ගුත්තිල කාව්‍යය.* කොළඹඃ ඇස්. ගොඩගේ සහෝදරයෝ.

15. තිලකසිරි, සිරි (2008). *සිංහල සන්දේශ කාව්‍යයේ සමාජ පසුබිම.* කොළඹඃ ඇස්. ගොඩගේ සහෝදරයෝ.

16. තිලකසිරි, සිරි (2011). *ගිරා සන්දේශය.* කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

17. තිලකසිරි, සිරි (2012). *හංස සන්දේශය.* කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

18. තිලකසිරි, සිරි (2013). *ගිරා සන්දේශ විමර්ශනය.* කොළඹඃ සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

19. තිලකසිරි, සිරි (2013). *සන්දේශ කාව්‍ය සාහිත්‍යය.* කොළඹඃ සී/ස ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

20. තෙන්නකෝනුන්, රෑ (1960). *අපේ පැරැණි අසුන් කවි.* කොළඹඃ සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

21. ධර්මකීර්ති හිමි, රත්මලානේ (1902). *හංස සන්දෙශය.* කොළඹඃ සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්.) සමාගම.

22. ධර්මාරාම හිමි, රත්මලානේ (2018). *සැළලිහිණි සන්දෙශය සහ එහි පුරාතන සන්නය.* විද්‍යාලංකාර ප්‍රකාශන කැලණිය.

23. පඤ්ඤාකිත්ති හිමි, කොටහේනේ අරුණා තිලක, අහුන්ගල්ලේ (1879). *සාහිත්‍යය.* සංස්කෘතික කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව.

24. පඤ්ඤාකිත්ති හිමි, කොටහේනේ (1959). *සාහිත්‍ය කථා - 1.* කළුතරඃ කළුතර විද්‍යාදීප පොත්හල.

25. පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ (2009). *හංස සන්දේශය.* කොළඹඃ සූරිය ප්‍රකාශකයෝ.

26. පඤ්ඤාසාර හිමි, දෙහිගස්පේ., සහ විමලධම්ම හිමි, පලන්නෝරුවේ (1933). *සාරදීපිකා ගිරා සන්දෙස වණ්ණනා.* කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

27. පඤ්ඤාසේකර හිමි, දේවහන්දියේ., සේනක, සිරිමෙවන් (1984). *ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ලේඛක තොරතුරු.* ශ්‍රී ලංකා රජයේ මුද්‍රණාලය.

28. බලගල්ලේ, විමල් ජී (1999). *සිංහල සාහිත්‍යය.* පාදුක්කඃ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.

29. රතනරංසි හිමි, කනදූල්ලේ (2005). *මයුර විවරුව.* බත්තරමුල්ලඃ රත්න පොත් ප්‍රකාශකයෝ.

30. වජිරඤාණ හිමි, හොරණ., අභයගුණවර්ධන, වෙ.වී., කාරියකරවන, එඩ්මන්., දිසානායක, විමල්., සුගතදාස, කේ.බී., රුවන්පතිරණ, මොනිකා., අමරදාස, කේ.ජී (1977-78). *සාහිත්‍යය.* කොළඹඃ සංස්කෘතාක කටයුතු දෙපාර්තමේන්තුව.

31. වජිරඤාණ හිමි, හොරණ (1992). *සිංහල සාහිත්‍ය ග්‍රන්ථ ප්‍රදීපිකා.* කොළඹඃ ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

32. වික්‍රමසිංහ, කේ.ඩී.පී (1961). *සිංහල ලේඛක පරපුර.* කොළඹඃ සීමාසහිත ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

33. වික්‍රමසිංහ, කේ.ඩී.පී (1964). *කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍යය.* මහරගමඃ තරංජී ප්‍රින්ට්ස්.

34. සන්නස්ගල, උපුල් ශාන්ත (2010). *ගිරා සන්දේශය පුරාවෘත්ත විශ්වකෝෂය.* නුගේගොඩඃ සංහිඳ මුද්‍රණ සහ ප්‍රකාශන.

35. සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර (1961). *සිංහල සාහිත්‍ය වංශය.* කොළඹඃ ලේක් හවුස් මුද්‍රණාලය.

36. සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර (1962). *සිංහල සන්දේශ සාහිත්‍යය.* කොළඹඃ ලේක් හවුස් මුද්‍රණාලය.

37. සූරවීර, ඒ.වී., විජයසූරිය, විමල (1991). *තිසර සන්දේශය.* කොළඹඃ ලේක් හවුස් පොත්හල.

38. සුරවීර,ඒ.වී (2006). *තිසර සන්දේශය.* කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

39. සේනානායක, ජී.එස්.බී (1978). *හංස සන්දේශය.* කොළඹ: ප්‍රදීප ප්‍රකාශකයෝ.

40. සොරත හිමි, වැලිවිටියේ (1969). *එලු සඳස් ලකුණ.* ගල්කිස්ස: අභය ප්‍රකාශකයෝ.